# කෝසිය ජාතකය

තවද මුළුලොවට තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසිය රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව ඉකුත්වතසේමයයි දතයුතු

ඒ කෙසේද යත්

එක් රජ්ජුරුකෙණෙක් නොකාලයෙහි යුද්ධයට නික්ම මඟුල්උයන කඳයුරු බැඳගෙණ උන්නාහ. ඒ වෙලාවට එක්බමුණෙක් උනපඳුරක් මධ්‍යයෙහි  සැතපුනේය. කව්ඩෝ උණ පඳුර වටකොටගෙණ උන්නාහ. බකමුනු තමාට බල ඇතිවූ රූපිවත් නොවි දහවල්ම පිටත්විය. එවිට වටකොටගෙණ උන් කවුඩෝ ඔළුවේ ඈන එතන එලාපුවාහ. රජ්ජුරුවෝත් ඒ දැක තමන්ට අමාත්‍යකම් කරමින් සිටියාවූ බෝධිසත්වයන් අතින් මේ කිමෙක්දැයි විචාළහ. බෝධිසත්වයෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මේ බකමුනා තමාට නොකාලයෙහි පිටත්වූ හෙයින් බොහෝ විනාශයට පැමිණියේය. ඉදින් දේවයන් වහන්ස සබකනොවි සැපසේම පලායන්නේයයි යනාදීන් වදාළසේකී. රජ්ජුරුවෝ ඒ අසා යහපතැයි සිතා පෙරලා රජගෙට ගියහයි වදාරා කෝසිය ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය. එසමයෙහි අමාත්‍යයව උන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේකී.